# 03 යුරෝපයේ පුනරුදය

## හැඳින්වීම

පුනරුදය යන වචනයේ සරල අදහස යළි පිබිදීම වේ. 14 වන සියවසේ සිට 16 වන සියවස දක්වා යුරෝපයේ ශාස්ත්‍රීය, ආගමික හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල පුළුල් පරිවර්තනයක් සිදු වූ අතර එහි දී පැරණි ග්‍රීක - රෝම ශිෂ්ටාචාර පිළිබඳ යුරෝපීයන් තුළ ප්‍රබල උනන්දුවක් ඇති විය. මෙම පරිච්ඡේදයේ දී පුනරුදය ලෙස හඳුන්වා ඇත්තේ පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල ආභාසය ලබමින් යුරෝපය තුළ ඇති වූ එම පුළුල් පරිවර්තනය යි. පුනරුදයට පසුබිම් වූ හේතු, ශාස්ත්‍රීය දියුණුව, චිත්‍ර, මූර්ති හා ගෘහ නිර්මාණ ශිල්පයන්හි ඇති වූ ප්‍රගමනය මෙන් ම විද්‍යා, වෛද්‍ය විද්‍යා, දර්ශනය වැනි ක්ෂේත්‍රයන්හි පිබිදීම පිළිබඳව ද මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.


## 3.1 පුනරුදයේ පසුබිම

යුරෝපයේ පුරාතන යුගයේ ඉතා දියුණු මට්ටමක පැවැති ග්‍රීක-රෝම ශිෂ්ටාචාර පිළිබඳව 7 ශ්‍රේණියේ දී ඔබට ඉගෙනීමට ලැබුණි. ක්‍රි. ව. පස්වන සියවසේ රෝම ශිෂ්ටාචාරය බිඳ වැටීමත් සමඟ යුරෝපයේ එතෙක් පැවැති පැරණි යුගය අවසන් විය. ඉන් පසු එළඹුණු වසර දහසක පමණ කාලය (ක්‍රි. ව. 500-1500) යුරෝපයේ මධ්‍යතන යුගය ලෙස සැලකේ.

මධ්‍යතන යුගය අවසන් කාලයේ දී යුරෝපීයන් තුළ පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර කෙරෙහි ප්‍රබල උනන්දුවක් ඇති විය. ඒ අනුව ග්‍රීක රෝම ශිෂ්ටාචාරවලට අයත් පොතපත හැදෑරීමටත්, එම ශිෂ්ටාචාරවල භාවිතා කෙරුණු ග්‍රීක් හා ලතින් භාෂා අධ්‍යයනයටත්, යුරෝපීයෝ යොමු වූහ. මෙසේ ග්‍රීක් හා රෝම ශිෂ්ටාචාර ගැන කරුණු ගැඹුරින් හැදෑරීම මෙන් ම ඒවායේ පැවැති සංස්කෘතිකාංග නැවත යුරෝපයේ ජනප්‍රිය වීමට පටන් ගැනීමත් විශේෂයෙන් කැපී



රූපය 3.1 *ඉතාලියේ නගරයක්*

රූපය 3.2 *ජොහැන්නස් ගුටෙන්බර්ග් හා ඔහුගේ මුද්‍රණ යන්ත්‍රය දැක්වෙන සිතුවමක්*

පෙනෙන ලක්ෂණයකි. යුරෝපයේ චින්තනමය හා ප්‍රායෝගික වශයෙන් ඇති වූ මෙම පරිවර්තනය නිසා ග්‍රීක රෝම ශිෂ්ටාචාර නැවත පණ ලැබූ ස්වරූපයක් ගත්තේ ය. මෙම තත්වය සැබවින් ම යුරෝපා ඉතිහාසයේ ඇති වූ පුනරුදයක් හෙවත් යළි පිබිදීමකි.

14 වන සියවසේ සිට 16 වන සියවස දක්වා යුරෝපය තුළ කලාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල සිදු වූ මෙම පුළුල් පරිවර්තනය වර්තමාන ලෝක ඉතිහාසය හැඩගැස්වීමට බෙහෙවින් බලපෑවේ ය. මෙම පරිවර්තනය මුලින් ම ආරම්භ වූයේ ඉතාලියෙනි.

## ✯ පුනරුදය ඇති වීමට හේතු

**1. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි බලයට යටත් වීම.**

ඈත අතීතයේ සිට ම යුරෝපය හා ආසියාව අතර වෙළෙඳ සබඳතා පැවැතුණි. සාම්ප්‍රදායික වෙළෙඳ මාර්ග ඔස්සේ ආසියාවෙන් යුරෝපයට ගෙන යන ලද වෙළෙඳ ද්‍රව්‍ය විකුණන වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස කොන්ස්තන්තිනෝපල් නගරයට වැදගත්කමක් ලැබුණි. යුරෝපා රටවල වෙළෙන්දෝ එම නගරයට පැමිණ වෙළෙඳ ද්‍රව්‍ය ලබාගෙන යුරෝපා රටවලට අලෙවි කර ලාබ ලැබූහ.

1453 වර්ෂයේ දී, ඉස්ලාම් භක්තිකයන් වූ තුර්කි ජාතිකයන් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම නිසා යුරෝපා වෙළෙඳාමට ප්‍රබල පහරක් වැදුණි.

මෙම අවධිය වන විට යුරෝපයේ ක්‍රිස්තු භක්තිකයන් හා බැහැරින් සිටි ඉස්ලාම් භක්තිකයන් අතර ගැටුමක් පැවැතුණි. ඉස්ලාම් ආගම ඇදහූ තුර්කීන් මෙසේ කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම නිසා, යුරෝපයේ ක්‍රිස්තියානි වෙළෙඳුන්ට, තවදුරටත් එය භාවිත කිරීමට ඉඩ නොලැබිණි. මේ නිසා එහි සිටි උගත්තු කොන්ස්තන්තිනෝපලයේ පුස්තකාලවල තිබූ වටිනා ග්‍රීක රෝම පොත්පත් ආදිය ද රැගෙන ස්වකීය රටවල් කරා පලා ගිය අතර එකී භාෂා හැදෑරීමට අවශ්‍ය ග්‍රීක් හා ලතින් භාෂා අදාළ නගරවල ප්‍රචලිත කිරීමටත්, ක්‍රියා කළහ. ඉතාලියේ බොලොඤ්ඤා වැනි විශ්වවිද්‍යාලවල දී එම කෘති ගැඹුරින් හැදෑරූ අතර එමගින් පැරණි ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර නැවත පණ ලැබූ තත්වයකට පත් විය.

**2. වෙළෙඳාම දියුණුවීම හා ධනවතුන් පිරිසක් බිහි වීම.**

ක්‍රි. ව. දොළොස්වන සියවසේ සිට යුරෝපයේ වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති වූ දියුණුව පුනරුදයට බලපෑ දිගුකාලීන හේතුවකි. මෙම අවධියේ පෙරදිග හා අපරදිග රටවල් අතර පැවැති වෙළෙඳාම නිසා ඉතාලියේ වැනීසිය, ජිනෝවා, ෆ්ලෝරන්ස් වැනි දියුණු වෙළෙඳ නගර බිහිව තිබුණි. එම නගරවල සිටි ධනවතුන්ට කලාත්මක අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට විවේකයක් තිබූ අතර, ඊට අනුග්‍රහ දැක්වීමට අවශ්‍ය තරම් ධනයක් ද තිබුණි. පුනරුදය ඉතාලියේ ආරම්භ වීමට එහි ධනවතුන් පිරිසක් බිහිව සිටීම වැදගත් සාධකයක් විය. ෆ්ලෝරන්ස් නගරයේ සිටි මෙඩිසි නම් ධනවත් පවුල එහි කලාත්මක කටයුතුවලට අතහිත දුන් ධනවතුන්ට උදාහරණයකි.

**3. බුද්ධි ප්‍රබෝධය**

රෝම ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ගත වූ කාලය තුළ, යුරෝපයේ ක්‍රිස්තු සභාව හා පූජකවරුන් කේන්ද්‍ර කොටගත් අධ්‍යාපන ක්‍රමයක් පැවතුණි. දේවධර්මය, දර්ශනය, නීතිය වැනි විෂය කිහිපයක් පමණක් ඒවායේ ඉගැන්වී ය. එහෙත් දොළොස්වන සියවසින් පසු යුරෝපයේ විශ්වවිද්‍යාල බිහි වන්නට විය.

| මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල | |
|---|---|
| රට | විශ්වවිද්‍යාලය |
| ඉතාලිය | බොලොඤ්ඤා, පාදුවා |
| ප්‍රංශය | පැරිස් |
| එංගලන්තය | ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් |

මෙම විශ්වවිද්‍යාලවල, පැරණි සාහිත්‍ය, ඉතිහාසය, නාට්‍ය වැනි විෂයන් රාශියක් ඉගැන්වූ නිසා නව උගතුන් පිරිසක් බිහි විය. එසේ ම එකී විශ්වවිද්‍යාලවල පර්යේෂණ කටයුතුවල දී ග්‍රීක රෝම පොත්පත් යොදා ගැනුණු අතර පැරණි සාහිත්‍ය අධ්‍යයනයට ද විශේෂ තැනක් ලැබිණි. මේ නිසා යටපත් වී පැවැති ග්‍රීක රෝම විද්‍යාත්මක හා කලාත්මක දැනුමේ නව පිබිදීමක් ඇති විය.

මෙතෙක් කාලයක් විශ්වවිද්‍යාලවල පවා අධ්‍යයන කටයුතුවලට අවශ්‍ය ග්‍රන්ථ පිටපත් කිරීමට සිදුව තිබුණි. මෙසේ පොත්පත් අතින් ලිවීමත් පිටපත් කිරීමත් අධ්‍යාපනය එක්තරා පිරිසකට පමණක් සීමා වීමත් වැනි හේතු නිසා දැනුම ව්‍යාප්ත වීමේ යම් යම් ගැටලු තිබුණි. මේ අතර පුනරුද සමයේ දී ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම හේතු කොටගෙන දැනුම ව්‍යාප්ත වීමේ විප්ලවයක් සිදු විය. එක් පොතකින් පිටපත් දහස් ගණනක් වුව ද කෙටි කලකින් නිම කර ගැනීමට ලැබීම විශේෂ ජයග්‍රහණයක් විය. මෙසේ මුද්‍රණ යන්ත්‍රය නිපදවීම යුරෝපා පුනරුදයේ ව්‍යාප්තියට තුඩුදුන් ප්‍රධාන කරුණකි.

## 3.2 පුනරුදය ඇතිවීම

**✩ නව උගතුන් බිහිවීම**

පුනරුද සමයට පෙර යුරෝපා රටවල භාවිත වූයේ එක් එක් රටවලට හෝ ප්‍රදේශවලට සීමා වූ භාෂාවන් වේ. පුනරුද සමයේ දී ග්‍රීක් හා ලතින් භාෂාවෙන් ලියවුණු පොත්පත් පරිශීලනය වැඩිවීම නිසා එම භාෂාවන්ගේ නවෝදයක් ඇති විය. එමෙන් ම මෙකල ග්‍රීක් හා ලතින් භාෂාවන් ඉගෙනීම විලාසිතාවක් බවට පත්ව තිබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රීක් හා ලතින් භාෂා මෙන් ම සාහිත්‍යය ඉගෙනීම ද පුළුල් ලෙස පැතිරිණ. මේ නිසා නව උගතුන් රැසක් බිහි විය. පුනරුද සමයේ බිහි වූ ගත් කතුවරුන් කිහිප දෙනෙකු පිළිබඳව පහත වගුවේ දැක්වේ.



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

| ගත් කතුවරයා | රට |
| --- | --- |
| ඩාන්ටේ | ඉතාලිය |
| විලියම් ශේක්ෂ්පියර් | එංගලන්තය |
| ඉරාස්මස් | ප්‍රංශය |

☆ **මානවවාදය ඉස්මතු වීම**

පුනරුද සමයට පෙර සියල්ලට ම වඩා දෙවියන් උතුම් ය, යන සංකල්පය ඉදිරියෙන් පැවතුණි. එය දේවවරම්වාදය ලෙස හැඳින්වේ. එහෙත් පුනරුද සමයේ දී මානවයාගේ කටයුතු පිළිබඳව වැඩි වැඩියෙන් හැදෑරීම් සිදු කෙරුණු අතර එමගින් මානවවාදය යන සංකල්පය ප්‍රචලිත විය. එහි ප්‍රතිඵල වශයෙන් ලෝක ඉතිහාසය තුළ මානවයා මෙතෙක් පැමිණි ගමන් මග, මිනිසාගේ කලාත්මක හැකියාව, ආදිය කෙරෙහි අවධානය යොමු කෙරුණු අතර ඉතිහාසය, කලාව වැනි නව විෂය රැසක් බිහි විය. මෙපරිද්දෙන් අධ්‍යාපනය, ආගම හැදෑරීමට පමණක් සීමා නොවී මිනිසා හා ජන ජීවිතය පිළිබඳ හැදෑරීමක් බවටත් පත් විය.

## කලා ශිල්ප

පුනරුද සමයේ කලා ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රබල පරිවර්තනය කැපී පෙනෙන එකකි. ඊට පෙර අවධියේ, පල්ලියේ අනුග්‍රහය මත ආගමික චින්තනය පදනම් කරගෙන කලා නිර්මාණ හැඩ ගැසී තිබුණි. පුද්ගලයා තුළ ආගමික භක්තිය ජනිත කරවීම මෙම කලා නිර්මාණවල පරමාර්ථය විය. එහෙත් ග්‍රීක රෝම අභාසය ලද පුනරුද සමයේ කලාව තුළ රස වින්දනයට මූලිකත්වය හිමි විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙකල නිර්මාණය කරන ලද චිත්‍ර හා මූර්තිවල නිරුවත් හෝ අඩ නිරුවත් රූප දකගත හැකි ය. පුනරුද සමයේ දී ලෞකික රස වින්දනය අගය කළ ධනවත් පිරිස් කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ඉදිරිපත් වීම, කලා ශිල්පයන්හි ප්‍රබෝධයක් ඇති වීමට විශාල රුකුලක් විය. ඊට පෙර කලා නිර්මාණවල පැවැති ලක්ෂණත්, පුනරුද සමයත් සමග එය වෙනස් වූ ආකාරයත් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| පුනරුදය සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවය | පුනරුද සමයේ කලා ශිල්ප |
| --- | --- |
| ආගමික මුහුණුවරක් ගැනීම. | ලෞකිකත්වයට මූලිකත්වය ලබා දීම. |
| ක්‍රිස්තුස් වහන්සේ, කන්‍යා මරියතුමිය හෝ ජනප්‍රිය සාන්තුවරයන් නිර්මාණවලට වස්තු විෂය වීම. | රජවරුන්, බිසෝවරුන්, කුමර කුමරියන්, ධනවත් පවුල්වල අය ද වස්තු විෂය කරගැනීම. |
| ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වීම සහ ඔවුන්ගේ නිර්මාණ එම ශ්‍රේණියේ නමින් හැඳින්වීම | නිර්මාණය කර්තෘගේ නමින් ම එළි දැක්වීම. |
| පල්ලිය පමණක් කලා නිර්මාණවලට අනුග්‍රහ දැක්වීම. | විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම. |
| ආගමික භක්තියක් ජනිත කිරීම මූලික අරමුණ වීම | රස වින්දනය ඇති කිරීම මූලික පරමාර්ථය වීම |
| ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොවීම. | ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරීම. |

## චිත්‍ර කලාව

චිත්‍ර කලාව පුනරුද සමයේ ප්‍රබල වෙනසකට ලක් වූ කලා මාධ්‍යයකි. ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරය නව චිත්‍ර කලාවක් බිහි කළ මධ්‍යස්ථානය විය. මෙතෙක් ආගමික වශයෙන් වැදගත් වූ ක්‍රිස්තුස් වහන්සේ, කන්‍යා මරියතුමිය වැනි තේමා වෙනුවට ලෞකිකත්වයට මුල් තැන දුන් චිත්‍ර නිර්මාණ පුනරුද සමයේ දී දක්නට ලැබේ.

මෙහි දැක්වෙන මොනාලිසා සිතුවම සමහර විට මීට පෙර ඔබ දැක තිබෙන්නට පුළුවන. මෙවැනි විස්මිත සිතුවම් නිර්මාණය කළ කලා ශිල්පීන් බිහි වූයේ, පුනරුද සමයේ දී ය. මීළඟට අපි එබඳු කලා ශිල්පීන් කිහිපදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳව මඳක් විමසා බලමු.



රූපය 3.3 *මොනාලිසා*



රූපය 3.4

### ලියනාඩෝ ඩාවින්චි

ලියනාඩෝ ඩාවින්චි ඉතාලි ජාතිකයෙකි. ඔහු චිත්‍ර ශිල්පියෙකු මෙන් ම ගෘහනිර්මාණ ශිල්පියෙකු, ඉංජිනේරුවෙකු කවියෙකු හා සංගීතඥයෙකු ද විය. මොනාලිසා හා ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය නම් වූ චිත්‍ර එතුමාගේ තෙලිතුඩෙන් නිර්මාණය වූ, විශිෂ්ට නිර්මාණ ලෙස පිළිගැනේ.



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*



රූපය 3.5 *අන්තිම රාත්‍රී භෝජනය*



රූපය 3.6
*ලියනාඩෝ ඩාවින්චි විසින් අඳින ලද තවත් චිත්‍රයක්*



රූපය 3.7

## මයිකල් ආන්ජිලෝ

මයිකල් ආන්ජිලෝ විශිෂ්ට චිත්‍ර ශිල්පියෙකි. එසේ ම ඔහු, මූර්ති ශිල්පියෙකු මෙන් ම ගෘහනිර්මාණ ශිල්පියෙකු ලෙස ද ප්‍රකට ය. රෝමයේ සිස්ටයින් දේව මන්දිරයේ සිවිලිමේ ඇඳ ඇති සිතුවම් මයිකල් ආන්ජිලෝගේ විශිෂ්ටතම නිර්මාණ ලෙස සැලකේ.

අවසාන විනිශ්චය නම් චිත්‍රය ඔහුගේ තවත් සුවිශේෂී සිතුවමකි.



රූපය 3.8 *මයිකල් ආන්ජිලෝ විසින් සිස්ටයින් දේව මන්දිරයේ අඳින ලද සිතුවම්*



රූපය 3.9 *පියෙටා රුව*



රූපය 3.10 *මයිකල් ආන්ජිලෝ නිර්මාණය කළ ඩේවිඩ්ගේ ප්‍රතිමාව*

## මූර්ති කලාව

මූර්ති කලාව පුනරුද සමයේ දියුණුවට පත් තවත් අංගයකි. කිරිගරුඬින් ප්‍රතිමා නෙළීම මෙකල කැපී පෙනෙන ලක්ෂණයකි. මයිකල් ආන්ජිලෝ පුනරුද සමයේ සිටි අග්‍රගණ්‍ය මූර්ති ශිල්පියෙකි. පියෙටා ප්‍රතිමාව, ඩේවිඩ්ගේ ප්‍රතිමාව හා මෝසෙස්ගේ ප්‍රතිමාව ඔහුගේ විශිෂ්ට නිර්මාණ අතර වේ. ඩොනෙටෙලෝ ද පුනරුද සමයේ ප්‍රතිමා ශිල්පීන් අතර කැපී පෙනේ. ෆ්ලෝරන්ස් නගරයේ නිර්මාණය කර ඇති ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව ඔහුගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

## ගෘහ නිර්මාණ

පුනරුද සමයේ ගොඩනැගිලි ඉදි කිරීමෙහි දී පැරණි රෝම ගෘහනිර්මාණ ශිල්පයේ යම් යම් ලක්ෂණ අනුකරණය කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. ඒ අනුව රෝම ගොඩනැගිලි තැනීමේ දී භාවිත කෙරුණු වටකුරු ආරුක්කු, උස් කුලුණු හා අර්ධ ගෝලාකාර ශිඛර සහිතව ගොඩනැගිලි ඉදිකිරීම මෙකල දක්නට ලැබේ. පුනරුද සමයේ ග්‍රීක හා රෝම ගෘහ නිර්මාණ ශිල්පය පිළිබිඹු කරන අපූර්වතම නිර්මාණයක් ලෙස රෝමයේ ශාන්ත පීතර දේවස්ථානය හඳුන්වා දිය හැකි ය. මයිකල් ආන්ජිලෝ හා දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූ රෆායල්ගේ නිර්මාණ රැසක් මෙහි දක්නට ලැබේ.



**ක්‍රියාකාරකම**

01. පුනරුද යුගයේ කලා ශිල්ප ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කලා ශිල්පය | නිර්මාණයේ නම | නිර්මාණ ශිල්පියාගේ නම |
|---|---|---|
| චිත්‍ර කලාව | | |
| ප්‍රතිමා කලාව | | |
| ගෘහ නිර්මාණ ශිල්පය | | |




*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

## ✯ නව විද්‍යාත්මක සොයාගැනීම්

පුනරුද සමයේ චින්තනමය වශයෙන් ඇති වූ කැපී පෙනෙන දියුණුව කලා ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී ය. යුරෝපීය උගතුන් පැරණි ඉතිහාසය, සාහිත්‍ය, දර්ශනය වැනි විෂයන් ගැඹුරින් හැදෑරීම නිසා සමාජය තුළ විචාර බුද්ධියේ දියුණුවක් ඇති විය. එතුළින් සම්ප්‍රදාය ම පිළිගැනීමට වඩා සෑම දෙයක් දෙස ම විචාරාත්මකව බැලීමට පෙළඹවීමක් ඇති විණ. එය විද්‍යාත්මක ක්ෂේත්‍රයේ දියුණුවට ඉවහල් වූ අතර නව විද්‍යාත්මක සොයාගැනීම් රැසක් සිදු කිරීමට ද බලපෑ කරුණක් විය.

### විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත



රූපය 3.11

### නිකලස් කොපර්නිකස්

පෘථිවිය ගෝලාකාර බවත් පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තූන් සූර්යයා වටා ගමන් කරන බවත් කොපර්නිකස් විසින් සොයා ගන්නා ලදි. ඒ අනුව මෙතෙක් පැවති පෘථිවිය පැතලි වස්තුවක් ය, යන මතය නිෂ්ප්‍රභ විය. කොපර්නිකස්ගේ මෙම නව සොයාගැනීම්, තාරකා හා ග්‍රහලෝක පිළිබඳ විද්‍යානුකූල අධ්‍යයනයකට මග හෙළි කළේ ය. මෙතුමාගෙන් තාරකා විද්‍යාවට සිදු වූ ඉමහත් සේවය නිසා ම තාරකා විද්‍යාවේ පියා ලෙස මොහු හඳුන්වනු ලැබේ.

### ජොහැන්නස් කෙප්ලර්


කොපර්නිකස් විසින් ඉදිරිපත් කළ අදහස් තහවුරු කළ කෙප්ලර් ඒවා තවදුරටත් ඉදිරියට ගෙන ගියේ ය. පෘථිවිය ඇතුළු අනෙක් ග්‍රහ වස්තූන් සූර්යා වටා වෘත්තාකාර මාර්ගයක ගමන් කරන බව මෙතෙක් පැවැති මතය විය. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල වෘත්තාකාරව නොව ඉලිප්සාකාරව සූර්යා වටා ගමන් කරන බව මෙතුමා විසින් සොයාගන්නා ලදි.




රූපය 3.12



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

රූපය 3.13

### ගැලිලියෝ ගැලිලි

විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙකු වූ මොහු දුරේක්ෂය නිපදවා ආකාශ වස්තු නිරීක්ෂණය කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස චන්ද්‍ර ආවාට හා කඳු, සූර්ය ලප හා බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයන් පිළිබඳ තොරතුරු නිරීක්ෂණය කළ හැකි විය.

### වෛද්‍ය විද්‍යාවේ දියුණුව

විලියම් හාවේ - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව වැදගත් තොරතුරු සොයා ගත්තේ ය.

වෛද්‍ය පැරසල්සස් - ලෙඩරෝග සෑදීමට තුඩු දෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම පිළිබඳ අත්හදා බැලී ය.

මෙම සොයාගැනීම් නූතන ඖෂධ විද්‍යාවේ දියුණුව කෙරෙහි ද විශාල ලෙස බලපෑවේ ය.

**මයිකල් සර්ටෙස්**

මයිකල් සර්ටෙස් රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිට වී ගොස් පෙණහැලි මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ සිරුර පුරා විසිරී යාම පිළිබඳ තොරතුරු සොයා ගත්තේ ය.


### ආගමික ප්‍රතිසංස්කරණ

විද්‍යාත්මක දියුණුව හා නව සොයාගැනීම් වැනි පුනරුද සමයේ ඇති වූ චින්තන විප්ලවය, නිසා සෑම අංශයක් දෙස ම විචාරාත්මකව බැලීමට ජනතාව පුරුදු වූහ. මේ අනුව ආගමික ඉගැන්වීම් හා ක්‍රිස්තු සභාව භුක්ති විඳි අසීමිත බලය දෙස ද විචාරාත්මකව බැලීමට ඔවුහු පටන් ගත්හ. පල්ලියේ බලයට එරෙහිව නැගී සිටි මෙම කණ්ඩායම් ප්‍රොතෙස්තන්තුවාදීන් හෙවත් රෙපරමාදුවාදීන් ලෙස හැඳින්වේ.

මධ්‍යතන යුගයේ අවසන් භාගයේ සිට ම ඇතැම් පූජකයන්ගේ දූෂණවලට විරුද්ධව විවේචන එල්ල විය. මෙලෙස විවේචන ඉදිරිපත් කළ අය අතර එංගලන්තයේ ජෝන් වයික්ලිෆ්, ප්‍රංශයේ ඉරාස්මස් ආදීන් කැපී පෙනේ.

පුනරුද සමයේ දී ක්‍රිස්තියානි පල්ලියට විරුද්ධව මතු වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මාටින් ලූතර්, ජෝන් කැල්වින් වැනි නායකයන්ගේ මූලිකත්වයෙන් තවදුරටත් ඉදිරියට ගියේ ය. ජර්මනියේ උපන් මාටින් ලූතර් විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පදවියක් ද දැරී ය. පල්ලියේ ඉගැන්වීම් තුළ බයිබලයේ ඉගැන්වීම්වලට පටහැනි බොහෝ දේ ඇති බව හෙතෙම ප්‍රත්‍යක්ෂ කර ගත්තේ ය. මේ වකවානුවේ දී ජර්මනියේ විටෙන්බර්ග් නුවර දී පව් සමා කිරීමේ පත්‍ර විකිණීමේ නිරතව සිටි පූජකයෙකු ඔහුට මුණ ගැසිණි. පව් සමා කිරීමේ පත්‍ර විකිණීම දැකීමෙන් කම්පනයට පත් මාර්ටින් ලූතර් පියතුමා ඒ පිළිබඳ තම අදහස් ඇතුළත් පත්‍රිකාවක් විටෙන්බර්ග් දේවස්ථානයේ දොරේ ඇලවී ය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස මාටින් ලූතර් කතෝලික සභාවෙන් නෙරපා දැමී ය. ඉන් පසු මාටින් ලූතර් පල්ලියේ ඉගැන්වීම්වලට විරුද්ධව තවදුරටත් අදහස් ප්‍රකාශ කරන්නට විය. 15 වන සියවසේ දී මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීමත් සමග ලූතර්ගේ මෙම අදහස් ජර්මනියේ පමණක් නොව යුරෝපය පුරා ම පැතිර යන්නට විය. මොවුන්ගේ මෙම අදහස් ඇතුළත් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හැඳින්වූයේ රෙපරමාදු හෝ ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය වශයෙනි.



**ක්‍රියාකාරකම**

1. යුරෝපයේ පුනරුදය ඇසුරින් කෙටි ප්‍රශ්න පොතක් සකස් කරන්න.

2. පුනරුද සමයේ චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ සහ නව සොයාගැනීම් පිළිබඳ තොරතුරු රැස් කරන්න.